## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# පුරප්පාඩු

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල වෙත සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ (පූර්ණ කාලීන ස්ථිර පදනම මත)

**<u>පූර්ණ කාලීන ස්ථිර පදනම මත</u>**

## 1. විශේෂඥ වෛද්‍ය නිලධාරි

1. විශේෂඥ වෛද්‍ය නිලධාරි – විකිරණවේදි
2. විශේෂඥ වෛද්‍ය නිලධාරි – රසායනික ව්‍යාධිවේදි
3. විශේෂඥ වෛද්‍ය නිලධාරි – ක්ෂුද්‍රජීව
4. විශේෂඥ වෛද්‍ය නිලධාරි – ශල්‍ය වෛද්‍ය
5. විශේෂඥ වෛද්‍ය නිලධාරි – ප්‍රසව හා නාරි
6. විශේෂඥ වෛද්‍ය නිලධාරි – හෘද රෝග
7. විශේෂඥ වෛද්‍ය නිලධාරි – මනෝවෛද්‍ය
8. විශේෂඥ වෛද්‍ය නිලධාරි – පිළිකා රෝග

**<u>සුදුසුකම්:</u>**

2018 අංක 28 දරන වෛද්‍ය (සංශෝධන) පනතට අනුව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි/ ලියාපදිංචි විය හැකි වෛද්‍ය නිලධරයෙකු වීම.

හෝ

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය සහිත වෛද්‍ය නිලධරයෙකු වීම.

සහ

විශේෂඥ වෛද්‍ය (MD/MS) උපාධිය සමඟ කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මාණ්ඩලික සහතිකය (Board Certification) ලබා තිබීම. (2014.10.11 දින නිකුත් කරන ලද 1883/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ I වන පරිශිෂ්ටය).

සහ

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද “Certificate of Good Standing” ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MC 1-2 පියවර 14 - රු.(161,140 - 12 × 4,850 - 219,340).

## 2. දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරී

### 1. <u>දන්ත ශල්‍ය වෛද්‍ය - I ශ්‍රේණිය</u>

**සුදුසුකම්:**

දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති, පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන ආයතනවල II ශ්‍රේණිය වෛද්‍ය නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර නවයක (09) පළපුරුද්ද ලබා තිබීම.

සහ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 11.10.2014 දින නිකුත් කරන ලද 1883/17 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ II වන ඇමුණුම යටතේ පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධියක් ලබා තිබීම.

සහ

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MO 1-1 පියවර 14 - රු.(101,610 - 3 × 2,480 - 7 × 2,490 - 2 × 3,450 - 10 × 4,100 – 174,380).

### 2. <u>දන්ත ශල්‍ය වෛද්‍ය - II ශ්‍රේණිය</u>

**සුදුසුකම්:**

වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MO 1-1 පියවර 05 - රු.(101,610 - 3 × 2,480 - 7 × 2,490 - 2 × 3,450 - 10 × 4,100 - 174,380)

## 3. හෙද පාලිකා

**සුදුසුකම්:**

විශේෂ ශ්‍රේණියේ නිලධරයෙකු වීම.

සහ

ජාතික හෙද අධ්‍යාපන ආයතනය/ පශ්චාත් ප්‍රාථමික හෙද විද්‍යාල විසින් පවත්වනු ලබන වාට්ටු කළමණාකරණය හා අධීක්ෂණය/ ඉගැන්වීම හා අධීක්ෂණය/ මහජන සෞඛ්‍ය හෙදකම හා වින්නඹු කර්මය/ මානසික හෙදකම අඩංගු අවුරුදු 1 1/2 ක ඩිප්ලෝමා පාඨමාලාව හදාරා I වන ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා, අධ්‍යාපන, මහජන සෞඛ්‍ය) තනතුරක වසර පහක (05) සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

තෙවැනි කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර තිබීම.

සහ

පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු **25** ට නොඅඩු හා අවුරුදු **50** ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 8 පියවර 04 රු. (87,800 – 10 x 2,490 – 3,450 x 8 - 140,300) හි තබනු ලැබේ.

## 4. හෙද සොහොයුරි

**සුදුසුකම්:**

I වන ශ්‍රේණියේ හෙද නිලධරයෙකු වීම.

සහ

ජාතික හෙද අධ්‍යාපන ආයතනය/ පශ්චාත් ප්‍රාථමික හෙද විද්‍යාල විසින් පවත්වනු ලබන වාට්ටු කළමණාකරණය හා අධීක්ෂණය/ ඉගැන්වීම හා අධීක්ෂණය/ මහජන සෞඛ්‍ය හෙදකම හා වින්නඹු කර්මය/ මානසික හෙදකම අඩංගු අවුරුදු 1 1/2 ක ඩිප්ලෝමා පාඨමාලාව හදාරා ඉන් සමත් වූ නිලධරයෙකු වීම.

සහ

දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව තිබීම.

සහ

පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු **25** ට නොඅඩු හා අවුරුදු **50** ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 7 පියවර 23 රු. (55,910 – 10 x 800 – 11 x 1,190 – 10 x 1,320 – 10 x 1,350 - 103,700) හි තබනු ලැබේ.

## 5. වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී

**සුදුසුකම්:**

සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව ඇතුලු විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී ඉංග්‍රීසි භාෂාව ඇතුලුව විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත් වීම

සහ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මඟින් හෝ වෛද්‍ය රසායනාගාරවේදී උපාධියක් ලබා තිබීම

හෝ

සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් මෙහෙයවනු ලබන දෑ අවුරුදු පූර්ණ කාලීන වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම

සහ

වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම

හෝ

විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥයකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**වයස් සීමාව:**

අවුරුදු **22** ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 6 පියවර 01 රු. (55,110 – (10 x 800 – 11 x 1,190 – 10 x 1,320 - 10 x 1,350 – 102,900) හි තබනු ලැබේ.

## 6. විද්‍යුත් නිකර්පන රේඛන සටහන්කරු

**සුදුසුකම්:**

සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුලුව විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් එකවරකදී සමත් වීම.

සහ

සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන විද්‍යුත් නිකර්පන රේඛන සටහන්කරු එක් අවුරුදු පූර්ණකාලීන ඩිපලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 4 පියවර 01 රු. (53,510 - 10 x 800 - 11 x 1,190 - 10 x 1,320 - 10 x 1,350 – 101,300) හි තබනු ලැබේ.

## 7. විද්‍යුත් බන්තු රේඛන සටහන්කරු

**සුදුසුකම:**

සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුලුව විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් එකවරකදී සමත් වීම.

සහ

සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන විද්‍යුත් බන්තු රේඛන සටහන්කරු එක් අවුරුදු පූර්ණකාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 4 පියවර 01 රු. (53,510 - 10 x 800 - 11 x 1,190 - 10 x 1,320 - 10 x 1,350 – 101,300) හි තබනු ලැබේ.

## 8. වෘත්තීය චිකිත්සකවේදී

**<u>සුදුසුකම:</u>**

සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත් වීම

සහ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ වෘත්තීය චිකිත්සකවේදී උපාධියක් ලබා තිබීම

හෝ

සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන දෑ අවුරුදු වෘත්තීය චිකිත්සකවේදී ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම

සහ

වෘත්තීය චිකිත්සකවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම

හෝ

විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් වෘත්තීය චිකිත්සකවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**<u>වයස් සීමාව:</u>**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**<u>වැටුප් පරිමාණය:</u>**

MT 6 පියවර 01 රු. (55,110 – (10 x 800 – 11 x 1,190 – 10 x 1,320 - 10 x 1,350 – 102,900) හි තබනු ලැබේ.

## 9. අක්ෂි තාක්ෂණවේදී

**<u>සුදුසුකම:</u>**

සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් විද්‍යා විෂය ධාරාවෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් එකවර සමත් වීම.

සහ

සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් මෙහෙයවනු ලබන අක්ෂි තාක්ෂණවේදී දෑ අවුරුදු පූර්ණ කාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

සහ

අක්ෂි තාක්ෂණවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම.

හෝ

විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් අක්ෂි තාක්ෂණවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**<u>වයස් සීමාව:</u>**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**<u>වැටුප් පරිමාණය:</u>**

MT 6 පියවර 01 රු. (55,110 – (10 x 800 – 11 x1190 – 10 x 1320 - 10 x 1350 – 102,900) හි තබනු ලැබේ.

## 10. සෘජු නේත්‍රඥ

**<u>සුදුසුකම:</u>**

අක්ෂි තාක්ෂණවේදී තනතුරෙහි ස්ථිර කරන ලද සේවකයෙකු වීම, අදාල තනතුරේ II වන ශ්‍රේණියට අයත් කාර්යක්ෂමතා කඩයිම සමත් II වන ශ්‍රේණියේ හෝ ඊට ඉහළ නිලධරයෙකු විය යුතුය. අයදුම්පත් කැඳවන අවසාන දිනට අඛණ්ඩ වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

සහ

ශ්‍රී ලංකා අක්ෂි රෝහල මඟින් පවත්වනු ලබන මාස හයක (06) සෘජු නේත්‍රඥ පුහුණුව සම්පූර්ණ කර තිබිය යුතුය.

සහ

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**<u>වයස් සීමාව:</u>**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**<u>වැටුප් පරිමාණය:</u>**

MT 6 පියවර 01 රු. (55,110 – 10 x 800 – 11 x 1190 – 10 x 1320 - 10 x 1350 – 102,900) හි තබනු ලැබේ.

## 11. ඖෂධවේදී

**<u>සුදුසුකම:</u>**

සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම සහ දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සමත් වීම

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව සංයුක්ත ගණිතය, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සමත් වීම

සහ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රධානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ ඖෂධවේදී/ විද්‍යාවේදී (ඖෂධවේදී) උපාධියක් ලබා තිබීම.

හෝ

සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන ඖෂධවේදී දෑ අවුරුදු පූර්ණ කාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම

සහ

ඖෂධවේදීයෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම

හෝ

විදේශීය උපාධියක් ලබා ඇති අයෙක් නම් අක්ෂි ඖෂධවේදීයෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**<u>වයස් සීමාව:</u>**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**<u>වැටුප් පරිමාණය:</u>**

MT 6 පියවර 01 රු. (55,110 – (10 x 800 – 11 x 1,190 – 10 x 1,320 - 10 x 1,350 – 102,900) හි තබනු ලැබේ.

## 12. මනෝවිද්‍යාඥ

**<u>අධ්‍යාපන සුදුසුකම්:</u>**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මනෝ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් සහ මනෝ විද්‍යාව සම්බන්ධ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම්.

**<u>වෘත්තීය සුදුසුකම්:</u>**

රජය පිළිගත් වෛද්‍ය ආයතනයක සායනික මනෝ විද්‍යාව (Clinical Psychology) පිළිබඳ වසර දෙකක (02) පුහුණුවක් ලබා තිබීම.

සහ

මනෝ විද්‍යාව විශේෂඥවරයකුගේ අධීක්ෂණය යටතේ මාස හයක (06) පුහුණුවක් ලබා තිබීම.

**<u>වයස් සීමාව:</u>**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MA 5-1 පියවර 01 රු. (58,740 – (10 x 1190 – 15 x 1360 – 11 x 1670 – 109,410) හි තබනු ලැබේ.

## 13. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී

**සුදුසුකම්:**

සිංහල/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාවද ඇතුලුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් **06** කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් තුනක් එක්වරකදී සමත් වීම

සහ

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරෙහි කාර්යභාරයට අදාලව සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන වසර එකහමාරක (1 1/2) පූර්ණ කාලීන වෘත්තිමය ඩිප්ලෝමා (අභ්‍යන්තර) පාඨමාලාව සාර්ථකව හදාරා ඩිප්ලෝමා සහතිකය ලබා තිබිය යුතුය

සහ

කාන්තා පක්ෂයට පමණක් අයදුම් කළ හැක.

**වයස් සීමාව:**

අවුරුදු **22** ට නොඅඩු හා අවුරුදු **45** ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 5 පියවර 01 රු. (54,310 – 10 x 800 – 11 x 1,190 – 10 x 1,320 – 10 x 1,350 - 102,100) හි තබනු ලැබේ.

## 14. මහජන සම්බන්ධතා නිලධාරි

**සුදුසුකම:**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මහජන සම්බන්ධතා / මානව සම්පත් කළමණාකරණය / ජන මාධ්‍ය විෂය ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු **22** ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

PL 1-1 පියවර 02 රු. (42,600 - 10 x 755 - 18 x 1,135 - 70,580) හි තබනු ලැබේ.

## 15. ශ්‍රවණවේදී කාර්මික ශිල්පී

**<u>සුදුසුකම:</u>**

ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය **5** මට්ටමට ( NVQ **5**) නොඅඩු සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන පූර්ණකාලීන අවුරුදු දෙකක **(02)** න්‍යායාත්මක හා සීමාවාසික ශ්‍රවණවෙදී කාර්මික ශිල්පී ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම අධ්‍යාපන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන තුනක් (03) සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

සහ

ශ්‍රවණවේදී කාර්මික ශිල්පියෙකු ලෙස ශ්‍රී ලංකාව තුළ කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MA 2-1 පියවර 01 රු. (50,540 – (10 x 540 – 7 x 630 – 4 x 890 - 20 x 1,190 – 87,710) හි තබනු ලැබේ.

## 16. වාග් චිකිත්සකවේදී

**<u>සුදුසුකම:</u>**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් මගින් හෝ වාග් චිකිත්සාව පිළිබදව වසර **02** කට නොඅඩු පූර්ණ කාලීන ඩිප්ලෝමාවක් ලබා තිබීම

**වයස් සීමාව:**

අවුරුදු **22** ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

MT 6 පියවර 01 රු. (55,110 – 10 x 800 – 1,190 – 10 x 1,320 - 10 x 1,350 – 102,900) හි තබනු ලැබේ.

## 17. කාර්මික ශිල්පී (ශල්‍යාගාර)

**සුදුසුකම්:**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් වසර දෙකක (02) ශල්‍යාගාර කාර්මික ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

ශල්‍යාගාර කාර්මික ශිල්පියෙකු ලෙස අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන වසර දෙකක (02) ශල්‍යාගාර කාර්මික පුහුණු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම.

සහ

ශල්‍යාගාර කාර්මික ශිල්පියෙකු ලෙස අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

ශ්‍රී ලංකා යුධ හමුදා වෛද්‍ය බලකාය , සෞඛ්‍ය අමාත්‍යාංශය හා නිර්වින්දන විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනය විසින් මෙහෙයවන ලද වසර දෙකක (02) පූර්ණ කාලීන ශල්‍යාගාර කාර්මික ශිල්පී සහතික පත්‍ර පාඨමාලාව හදාරා තිබීම.

සහ

ශල්‍යාගාර කාර්මික ශිල්පියෙකු ලෙස අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සුදුසුකම් ලබා ගැනීමෙන් පසු වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

PL 3 පියවර 01 රු.(43,280 - 10 × 490 - 10 × 540 - 10 × 590 - 12 × 630 - 67,040) හි තබනු ලැබේ.

## 18. මධ්‍ය වන්ධ්‍යාකෘත ඒකක ක්‍රියාකරු

**<u>සුදුසුකම:</u>**

අධ්‍යාපන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන තුනක් (03) සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

හෝ

තනතුරෙහි කාර්යභාරයට අදාළ වන යන්ත්‍ර/ සූත්‍ර ක්‍රියාත්මක කිරීම පිළිබඳ කාර්මික පුහුණුව සහිත තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතාව (National Vocational Qualification - NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

PL 2 පියවර 01 රු. (42,300 - 10 x 490 - 10 x 540 - 10 x 590 - 12 x 630 – 66,060) හි තබනු ලැබේ.

## 19. රියදුරු

**<u>සුදුසුකම්:</u>**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම.

**<u>ප්‍රවීණතා:</u>**

මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ පැරණි රියදුරු බලපත්‍රයට අනුව මෝටර්රථ පැදවීමේ “A” ශ්‍රේණියේ රියදුරු බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රයට අනුව මෝටර්රථ පැදවීමේ “D” ශ්‍රේණියේ රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.

**<u>පළපුරුද්ද:</u>**

රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් ලබා තිබීම.

**<u>කායික සුදුසුකම් :</u>**

I. තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් දිවා රාත්‍රී කාලයේ රාජකාරි සඳහා සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර අවශ්‍යතාවය මත පැය 24 ම සේවා මුර වලට රාජකාරි සඳහා සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

II. අවම උස අඩි 05 යි අඟල් 2 1/2 ක් විය යුතුය.

III. ඇස් පෙනීම සම්බන්ධයෙන් පහත සඳහන් උපමාන වල දක්වා ඇති යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(අ). බර වාහන රියදුරන් බඳවා ගැනීමේදී ඇස් පෙනීම සම්බන්ධව ලංකා අක්ෂි වෛද්‍ය සංගමය පිළිගත් නිර්ණායක වන වම් ඇස සහ දකුණු ඇස **6/9** සීමාව තුළ පැවතිය යුතුය.

(ආ). වර්ණ අන්ධතාවය පරීක්ෂා කිරීමේදී ලංකා අක්ෂි වෛද්‍ය සංගමයේ නිර්දේශිත නිර්ණායකයන් අනුව වර්ණ අන්ධතාවය නොතිබිය යුතුය.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු **45** ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය:**

PL 3 පියවර 01 රු. (43,280 – 490 x 10 – 540 x 10 – 590 x 10 – 630 x 12 - 67,040) හි තබනු ලැබේ.

## 20. රෝහල් කාර්ය සහායක

**සුදුසුකම්:**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් ඇතුලුව විෂයන් හයක් සමත් වී තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු **45** ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

PL 1 පියවර 01 රු. (40,500 – 450 x 10 – 490 x 10 – 540 x 07 – 590 x 15 - 62,530) හි තබනු ලැබේ.

## 21. උපස්ථායක

**සුදුසුකම:**

අධ්‍යාපන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන තුනක් (3) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

PL 2 පියවර 01 රු. (42,300 - 10 x 490 - 10 x 540 - 10 x 590 - 12 x 630 – 66,060) හි තබනු ලැබේ.

## පොදු කොන්දේසි

සෑම අයදුම්කරුවෙකුම,

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම සෑම අපේක්ෂක/ අපේක්ෂිකාවක්ම ජෙනරාල් ශ්‍රීමත් ජොන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහලෙහි හෝ පැන නගිනු ලබන හදිසි අවශ්‍යතාවයන් මත නම් කරනු ලබන ඕනෑම ස්ථානයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

4. සෑම අයදුම්කරුවෙකුම අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම් කරනු ලබන තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය යුතුය.

5. සේවක අර්ථසාධක අරමුදල සඳහා ඔබගෙන් 10% දායකත්වයක්ද විශ්වවිද්‍යාලයෙන් 15% දායකත්වයක්ද දරණ අතර සේවක භාරකාර අරමුදල සඳහා විශ්වවිද්‍යාලයෙන් 3% දායකත්වයක් දරණු ලැබේ. (පාර්ලිමේන්තුව විසින් නීතිය මඟින් කරනු ලැබිය හැකි සංශෝධන වලට යටත්ව)

6. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමඟින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තිය සහ සේවා සහතික වල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් **2025.12.14** දිනට පෙර "විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර" යන ලිපිනයට යොමු කල යුතු අතර, ලියුම්කවරයේ ඉහල වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කල යුතුය.

7. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ.

8. අසම්පූර්ණකල ප්‍රමාද වී යොමුකරනු ලබන සහ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල් ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. අයදුම්පත්‍ර භාගත කර ගැනීමට සහ වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන්න.www.kdu.ac.lk / දුරකථන අංකය – 011 - 2044555.

**www.kdu.ac.lk**